




# රජ ගෙදරට හොරු පැනලා

**එක්තරා විශේෂඥ වෛද්‍යවරයෙක් තමාගේ සබඳතා අනුව විදේශීය ආයතනයකින් ස්නායු රෝග ප්‍රතිකාරය සඳහා වූ සිවුමහල් ගොඩනැගිල්ලක් සහිත රෝහලක් පරිත්‍යාග වශයෙන් ලබාගැනීමට මං පාදා ගත්තේය. ඒ බව කණ වැකුණු විගස ක්‍රියාත්මක වූ ඇමතියා එය අනුමත කිරීමට නම් අර කියාපු ගොඩනැගිල්ලේ මහල් දෙකක් තමාට දිය යුතු යයි කොන්දේසියක් පැනවීය.**

කලින් ඉඳන් හොරුන් නොහිටියාම නොවේ. ගෝනවල සුනිල් නමැති අපරාධකාරයාට උඩගෙඩි දෙමින් රාජකීය විද්‍යාලයේ අධිපතිට අණ දීමට හැකි වන අයුරින් ඔහු උහා තැබූ මහ හොරා රජ ගෙදරට අරක් අරන්ය. විදේශ ගුවන් සමාගම් සඳහා  කොන්තරත් දීමේ පිනෙන් මෙරට පවා ගෙවල් දොරවල් මිලට ගැනීමට වරම් ලද තවත් හොරුන් අනාරාධිතව රජ ගෙට රිංගා ගෙන සිටි බව අමතක නොකළ යුතුය.

එහෙම වුණත් සැබෑ හොරු කල්ලිය හීන් සීරුවේ රජ ගෙදරට ළඟා වුණේ මුළු රටම මවිත කරවමිනි. එහෙත් ඒ පැමිණීම සිදු වූයේ ආරාධනා පරිදිය. ආරාධනාව කළ ආතුරයා එසේ මෙසේ පුද්ගලයෙක් නොවේ. මහගෙදර මහ බලවතාය. තට්ටු දෙකේ බස් කබලක සුක්කානම අතට ගත් ඔහුට රැවුලයි කැඳයි දෙකම නැතිව බැරිය. අන්න ඒ ගැටළුව විසඳා ගැනීමට ඔහුට සිදු වූයේ හුරු පුරුදු හොර හමුදාවෙන් ටික දෙකනු ගෙන්වා ගැනීමට ය. ඒ ගෙන්වා ගත් ටික දෙනාත් පෙරාපු බඩුය. චෞර ක්‍රමවේදයෙහි කෙළ පැමිණි සූරයෝය.

බසයේ එක තට්ටුවක තමාගේ රාජප්‍රාප්තියට වඩාත් සහය දුන් කොළපාට වීරයන්ය. අනෙක් තට්ටුවේ නැතුවම බැරි සිය පක්ෂයේ සාමාජිකයන්ය. ඒ හැම දෙනාම ආවේ අවි පසුපසට කරගෙනය. වෙලාවට එළියට ගන්නට හිතාගෙනය. පරණ ඉටු දෙවියාට උදේ හවා පුද පූජා පවත්වන අතරමය. ඔහුගේ ආසිරි හා උවදෙස් ලබාගනිමිනි. ඒ පිරිස ලැග සිටි විමාන රත් වන්නට පටන් ගත්තේ ඒ කියාපු දේවතාවාගේ විමානයටත් රාජ උෟෂ්ණය වදින්නට වූ පසු ය. ඔන්න අපේ උතුමාට එරෙහිව මොකක් හෝ විභාගයක් කරන්නට යනවාය කියන ආරංචිය සැළවූ සැණින් පරලය වූ ඔහුගේ අග්‍රවර යට කී සොර මුල බිම හිට ගැනීමේ නවතම හර්තාලය ඇරඹූහ. එහෙම කළේත් එසේ මෙසේ තැනක නොව රාජ පුරුෂයන්ගේ ඉහළ මණ්ඩපයේ බුමුතුරුණු මතය. දූවිලි පොදක් වත් නොගෑවෙන විදියේ පිරිසිදු බිමකය.

නීතියේ ආධිපත්‍යය තහවුරු කරනවා යයි කැට කඩා කියමින් රජ මැදුරට පිවිසි නායකයා යටතේ ඒ නීති සම්පාදනය කරන හොර දෙටුවෝ ම සම්පාදක භූමිය මත වැතිරගෙන පෙරලි කරන විට ඔය කියාපු මහ ලොකු නීති වලට යන කල දසාව මොකක්ද? කන්නන්ගර මහතා කී විදියට බුලත් මඩිස්සලයට හෙණ ගැහුවාම හුණු කිල්ලෝටය ඉතිරි වෙන රටක් ඇද්ද?

කැලේ යන නයි රෙද්ද පල්ලේ දමා ගෙන "කනෝ කනෝ" යයි මොර දෙන මිනිහාගේ තැනට තවමත් මහරජතුමා වැටුණේ නැත . එහෙම අතරු අන්තරාවක් සිද්ද වෙන්නට ඉස්සර එතුමා හොර මුල ගෙදර යවා අත පිහදා ගන්න එක නම් සිකුරුය. ප්‍රශ්නය වඩාත් බරපතළ වන්නේ ඒවාගේ ගෙදර යවන ලද පිරිස නැවත වරක් ආපසු ගෙට රිංගාගන්නට ආ කල්හිය. යන යකා ගියේ කොරහ පමණක් බිඳ ගෙනය. එන යකා එක කොට එන්නේ කොරහ පෙරළාගෙන - යකැදුරාත් ගල ග්‍රහයෙන් අරගෙනය. එහෙම ආපු දාට තව තව සෙල්ලම් බලන්නට අපට වරම් ලැබෙන එක නම් සිකුරුය.

ආපසු එන දාට පරණ දේවතාවා පෙරටුකොටගෙන එන්නට එක පිරිසක් අර අඳිනවාය. එහෙම එනවාට මහරජතුමා කැමති නැත. එතැනත් තව තරගයක්. බිම වැතිර ගැනීමට අවසරයක් එනවාමය. රට ගැන හිතා කතා කරන මනුස්සයෙක් ඉතිරි නොවන්නේය. රට බල්ලට ගියත් තම තමන්ගේ මල්ල ලිහා දන් දෙන මුග්ධයෝ දැන් දිවයිනේම නැත . මල්ල පුරවා මලු කට බැඳ තැබීම අංක එකට වැටෙන සත් ක්‍රියාවක් වන්නේය.

මෙසේ ගැට ගැසීම සෙසු පටු අපට කළ හැකි රාජකාරියක් නොවන බව අන්තිම මොහොතේවත් අවබෝධ කරගත්තු මහරජතුමා ඊයේ පෙරේදා එයටත් ප්‍රතිකර්මයක් යොදා ගත්තේය. නම් දරාපු දෙටුවන් දෙදෙනකු තෝරාගෙන ඔවුන්ද රජ මැදුරට කැන්දා ගත්තේය. එතකොට හිටපු හා අලුතින් එන හොර කණ්ඩායම් කවරකට වුවත් අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කිරීමටත් දෙදෙනාම සමත් වන්නෝය.  දෙදෙනාම වයෝවෘද්ධ ඥානවෘද්ධ සකලවිධ ක්‍රමවේදයන්හි කෙළ පැමිණි හිටපු ඇමති යුවලකි.

යහපාලනයේ ශත සංවත්සරය (අවුරුදු නොව දවස් සියය) පිරෙනකොටම මෙබඳු ජ්‍යෙෂ්ඨ චෞර නායකයන් දෙදෙනකු අනාවරණය කර ගැනීමට මහරජු සමත්වීම සිදුවූයේද ජාතියේ පිනටමය. එහෙම නොකළා නම් රටට යන කල දසාව කුමක්ද?

වත්මන් විරුද්ධ පක්ෂය මෙහෙයවන දෙටුවා පිළිබඳව අගනා පුවතක් මට දැනගත හැකි වූයේ ඔහුගේ අමාත්‍යාංශයක රාජකාරි කළ ඉංජිනේරුවකුගෙනි. අමාත්‍යාංශයේ කීවත් ඔහු පුද්ගලික ආයතනයක නියෝජිතයා වශයෙන් එහි සේවයේ නිරතව සිටියෙකි. ඔහු කෙළින්ම අමාත්‍යාංශයට බැඳී නොසිටි හෙයින් ඒ තුළ සිදුවන සට කපට කටයුතු නිරීක්ෂණය කිරීම පහසු විය. දිනක් තමා සොයා ගෙන ආ ඇමතිතුමා අමාත්‍යාංශය සමග කොන්ත්‍රාත්තුවක් ගසා ගත් පුද්ගලික ආයතනයකට ගෙවිය යුතු වට්ටම ගෙවනුවස් දිය යුතු චෙක් පත ලියවා ගෙන අතින්ම අරන් ගිය බවය මට කීවේ. පසුව බැලූ කොට ඒ මුදල ඇමතිවරයාට දෙන පගාව නොහොත් සන්තෝසමය. ජනාධිපති තරගයට ඔන්න මෙන්න තියා ඒක ඉල්ලාගත්තේ බැරි වෙලාවත් ලොක්කාට ගැස්සිලා ගියොත් තමාගේ හොද්ද හිඳී යන බව දත් නිසාය.

එක්තරා විශේෂඥ වෛද්‍යවරයෙක් තමාගේ සබඳතා අනුව විදේශීය ආයතනයකින් ස්නායු රෝග ප්‍රතිකාරය සඳහා වූ සිවුමහල් ගොඩනැගිල්ලක් සහිත රෝහලක් පරිත්‍යාග වශයෙන් ලබාගැනීමට මං පාදා ගත්තේය. ඒ බව කණ වැකුණු විගස ක්‍රියාත්මක වූ ඇමතියා එය අනුමත කිරීමට නම් අර කියාපු ගොඩනැගිල්ලේ මහල් දෙකක් තමාට දිය යුතු යයි කොන්දේසියක් පැනවීය.

රෝහල ලැබුණේ නැත . යෝජනාව ලබා දුන් විශේෂඥ වෛද්‍යවරයාද රටට අහිමි විය. ඔහු රට හැර ගියේ එන පොට හොඳ නැති බව වැටහුණු නිසාය.

රජ ගෙදරට රිංගා ගෙන යහතින් වැජඹෙන හොර මුල ගැන කිව යුතු බොහෝ දේ ඇතත් ඒ නිදසුන ප්‍රමාණවත් බ වමට පෙනෙයි.

අප උපන් දේශය කළ පින් ඇති රන්බිමකි. පිරිසිදු බුදු දහම රැකගෙන ආ දහම් දිවයිනකි. ඒ අත්පත්කරගත් පින පල දී ගෙන එන යුගය දැන් උදා වී ගෙන එනවාය.

ජනතා පැතුම් ඉටු කරන්නෙමැයි කැප වෙමින් මහා ජන ප්‍රසාදයක් සහ අතිප්‍රබල ප්‍රාර්ථනා රාශියක්ද හිස දරාගත් ජනතාවක් සුවපත් කරනු පිණිස තෝරා ගන්නා ලද නව නායකයා කළ කී හැම දෙයක්ම ගංගා ජලයේ පා කර හරිමින් සමස්ථ දේශයටම එපා වූ දීනයන් නැවතත් ගැට ගසා මහා ජංජාලයක් කරනු වස් කැහැපට ගසා ගත් සොර දෙටුවන්ට පමණක් නොව සිල්ලර ගැට කපන්නන්ටත් ඉඩ සළසා නැවත වතාවක් රටම ප්‍රපාතයට හෙළීමේ මහා කුමන්ත්‍රණයක් අටවන තැනට නායකයා සහ බුද්ධිමත් මැති ඇමතිවරුන් පවා පිරිහෙන බවක් දුටු කෙනෙක් නැද්ද?

LA TROBE TAXATION SERVICES
*Your friendly tax accountants*



*La Trobe Taxation Services is in operation since 2001 and provide taxation services to businesses and individuals. Our areas of specialisation are individual tax returns, business tax returns, investment properties, GST, BAS, IAS, PAYG and registering of ABR. Whenever you have tax related issues we are here to assist you as possible as we could. Our fees are very reasonable and competitive.*

*La Trobe Taxation Services*
*Registered Tax Agent*
(ABN 67 251 931 300)

**CONTACT**
**Bundoora:**
**Mala: - 0401000421 or 03-94708241**
**Cranbourne:**
**Janaka:- 0403728635 or 03-87868033**

**Email: latrobetax@yahoo.com.au**

**www.latrobetax.com.au**